# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1793/23 – 2013 ජනවාරි 18 වැනි සිකුරාදා – 2013.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පනාවල් කෝරළේ බටහිර සුළු කොට්ඨාසයේ, පත්බේරිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක ආර්/කේආර්ඩබ්ලිව්/2012/373 හා 2012 සැප්තැම්බර් මස 17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.2371ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අක්ෂර 'ඒ' – පුස්සැල්ල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2371ක් පමණ**

උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය, පුස්සැල්ල වත්ත සහ පරකඩුව තැපැල් කාර්යාලය; නැගෙනහිරට: පුස්සැල්ල වත්ත සහ පරකඩුව තැපැල් කාර්යාලය සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ ප්‍රාදේශීය සභා මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/08/2012/පීසී/68.
2012 නොවැම්බර් මස 20 වැනි දින,
1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 178

1A – G 017171 – 350 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*